**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) මැලේරියාව 8 වන වටය සංරචකය - 2015**

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ (ජීඑෆ්ඒටීඑම්) මැලේරියාව 8 වන වටය සංරචකයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2009 සැප්තැම්බර් 17 දින එළඹි අංක එස්ආර්එල්-809-ජී10-එම් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යායනය හා ව්‍යාපෘති කාලය

ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මැලේරියාව නැවත ඇති වීම වැළැක්වීම හා ශ්‍රී ලංකාවේ මැලේරියාව හේතුවෙන් ඇතිවන මරණ සංඛ්‍යාව ශුන්‍ය මට්ටමක පවත්වා ගැනීම මඟින් මැලේරියාවෙන් තොර තත්ත්වය තහවුරු කරගැනීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඇඩ් මැලේරියා පාලන ව්‍යාපෘතියේ 8 වන වටය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 13,059,866 ක් වූ අතර, සම්පූර්ණ මුදලම මූල්‍යායනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර, 2014 සැප්තැම්බර් 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව ගෝලීය අරමුදල විසින් ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද අනෙකුත් වාර්තාවල ඇතුළත් කරන ලද තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති තොරතුරු එකඟ වන බව සහ.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බවත්ය.

**3. මූල්‍ය ප්‍රකාශන**

**3.1 මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.162,850,628 කට සමාන එජඩො 1,197,959 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,505,201,277 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2015 | | 2014 | | |
| | එජඩො | රු. | එජඩො | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 149,286 | 20,293,968 | 397 | 51,975 | 207,729,971 |
| මැලේරියා පාලන කටයුතු | 1,048,673 | 142,556,660 | 1,541,272 | 201,228,501 | 1,297,471,306 |
| | 1,197,959 | 162,850,628 | 1,541,669 | 201,280,476 | 1,505,201,277 |

## 3.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය | 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|---|
| | එජඩො | රු. | එජඩො | රු. |
| විදේශාධාර - ප්‍රදාන වලින් ලැබුණු මුදල් | 794,468 | 108,000,000 | 1,156,556 | 151,000,000 |
| දේශිය අරමුදල්වලට අදාළ විදේශාධාර | 232,980 | 31,671,273 | 22,978 | 3,000,000 |
| ටෙන්ඩර් ආදායමෙන් ලැබුණු මුදල් | 331 | 45,000 | 314 | 41,000 |
| වැඩසටහන් වියදම් සඳහා ගෙවූ මුදල් | (1,048,673) | (142,556,660) | (1,152,291) | (150,443,193) |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාවය) | (20,894) | (2,840,387) | 27,557 | 3,597,806 |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය | 267,173 | 36,319,519 | - | - |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම | 1,063 | 846,270 | - | - |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 8,903 | 1,210,289 | - | - |
| විදේශ විනිමය (පාඩුව)/ ලාභය | 3,946 | - | (103) | - |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික | (1,140) | (154,943) | - | - |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබුණු ශුද්ධ මුදල්** | 259,051 | 35,380,748 | 27,454 | 3,597,807 |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනය | (149,286) | (20,293,968) | (397) | (51,975) |
| ආයෝජන කටයුතුවල යෙදු වූ ශුද්ධ මුදල් | (149,286) | (20,293,968) | (397) | (51,975) |
| **මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| මහා භාණ්ඩාගාරයට මුදල් ආපසු ගෙවීම | (109,765) | (15,086,780) | (27,057) | (3,545,832) |
| මූල්‍ය කටයුතුවලට යෙද වූ ශුද්ධ මුදල් | (109,765) | (15,086,780) | (27,057) | (3,545,832) |
| මුදල්වල ශුද්ධ වැඩිවීම/ (ශුද්ධ අඩුවීම) | නැත | නැත | නැත | නැත |

## 4. විගණන නිරීක්ෂණ

### 4.1 ගිණුම්කරණ අඩුපාඩු

ව්‍යාපෘතියේ සේවකයින් 182 දෙනෙකු සඳහා සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 4.54 ක් වූ සේවාදායකයාගේ හා සේවයාගේ දායකය ගිණුම්ගත කරනු වෙනුවට සටහනක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි. තවද ඒ සඳහා ගෙවිය යුතු රු.මිලියන 2.27 ක් වූ අධිභාර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ඒ සඳහා වෙන්කිරීම් සිදුකිරීමට රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතියක් ලබාගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

### 4.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි අංක 371 (2)(ආ) | අරමුණු කළ කාර්යය නිමකළ වහාම ලබා ගන්නා ලද අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 187 කදී මුදා හරින ලද එකතුව රු.මිලියන 8.63 ක් වූ අත්තිකාරම් මාස 02 සිට මාස 10 දක්වා වූ කාලයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි අංක 756 | රු.මිලියන 65.91 කට සමාන එජඩො 457,524 කට ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් වලට අදාළව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා භෞතික සත්‍යාපනයන් සිදුකර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද පරිගණක හා අදාළ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 4.3.2 ඡේදය | වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා දැනටමත් දායක වී ඇති නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු.330,549 ක මුදලක් 2015 ජනවාරි 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 5.4.11 ඡේදය | අවස්ථා 151 කදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ රු.මිලියන 28.73 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට දන්වා නොතිබුණි. |

**5. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**5.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු අරමුදල් හා එහි උපයෝජනය 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ ලද අරමුදල් | | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 13.06 | 1,498 | 2.84 | 0.79 | 108.00 | 0.71 | 95.98 | 11.03 | 1,447.19 |
| | 13.06 | 1,498 | 2.84 | 0.79 | 108.00 | 0.71 | 95.98 | 11.03 | 1,447.19 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය විසින් මුදා හරින ලද රු.මිලියන 108 කට සමාන එජඩො මිලියන 0.79 කින් රු.මිලියන 95.98 කට සමාන එජඩො මිලියන 0.71 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. තවද, රු.මිලියන 15.09 කට සමාන එජඩො 109,765 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් අමාත්‍යාංශයට ආපසු ගෙවා තිබුණි. කෙසේ වුවද රු.මිලියන 7.83 ක් වූ ගෙවිය යුතු මුදල් 2015 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණි. 2009 සැප්තැම්බර් 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබූ රු.මිලියන 1,498 කට සමාන එජඩො මිලියන 13.06 ක වෙන්කිරීම්වලින් රු.මිලියන 1447.19 කට සමාන එජඩො මිලියන 11.03 ක මුදල් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ක්‍රියාකාරකම් 13 ක් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය මඟින් සලසන ලද එජඩො 599,498 ක වෙන්කිරීම් වලින් 2015 දෙසැම්බර් 31 දිනට මුළු වෙන් කිරීමෙන් සියයට 03 ක් නියෝජනය වන එජඩො 17,692 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද ක්‍රියාකාරකම් 56 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ සලසා තිබූ එජඩො 741,138 ක් වූ වෙන් කිරීම සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අදාළ අධිකාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අයවැය වෙන් කිරීම ඉක්මවා ක්‍රියාකාරකම් 03 ක් යටතේ එජඩො 3,794 ක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. ඊට අමතරව ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැයෙහි ඇතුළත් නොකරන ලද ක්‍රියාකාරකම් 17 ක් ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය තුළ එජඩො 25,811 ක් වැය කර තිබුණි.

(ඈ) මැලේරියාව තුරන් කිරීම හා වැළැක්වීම පිළිබඳ යළි හඳුන්වාදීමේ ජාතික වැඩසටහන යටතේ 2014 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය සඳහා නියාමන හා ඇගයීම් සැලැස්මක් පිළියෙල කර තිබුණි. වැඩසටහන විසින් වර්ග 06 ක් යටතේ කාර්යයන් 161 ක් හඳුනාගෙන 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණද කාර්ය පදනම් කාර්යසාධනය පිළිබඳ ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 වන විටත් වාර්තා කර නොතිබුණි. තවද කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පිරිවැය, ඇස්තමේන්තු කර සැලැස්මේ දක්වා නොතිබුණි.

(ඉ) 2014 – 2018 දක්වා කාල පරිච්ඡේදය සඳහා නියාමන හා ඇගයීම් සැලැස්ම අනුව, මැලේරියාව තුරන් කිරීමේ ජාතික වැඩසටහන පිළිබඳ කාර්යසාධනය සම්බන්ධයෙන් බාහිර සමාලෝචන ක්‍රමවත් කාල පරතරයන්හි සිදු කළ යුතුය. කෙසේ වුවද එවැනි සමාලෝචන, ව්‍යාපෘතිය විසින් 2013 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි. 2013 වර්ෂයේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිළියෙල කළ යුතු කාලය පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක් (time bound action plan), මැලේරියා මර්දන ව්‍යාපාරය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2015 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි. තවද අනාගත අවශ්‍යතා හඳුනාගැනීම සඳහා සිදුකළ යුතු තක්සේරුවක්ද සිදු කර නොතිබුණි.

**5.2 භෞතික ප්‍රගතිය**

**5.2.1 ජංගම මැලේරියා සායන**

මැලේරියාව තුරන් කිරීම හා වැළැක්වීම පිළිබඳ යළි හඳුන්වාදීමේ ජාතික වැඩසටහනේ කාර්යය අංක 7.2 යටතේ කලින් හඳුනාගැනීම හා මැලේරියා රෝගීන්ට කඩිනම් ප්‍රතිකාර කිරීමේ කාර්යය සඳහා ජංගම මැලේරියා සායන 2,640 ක් පැවැත්වීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 8.58 ක වෙන්කිරීමක් අයවැය මඟින් සලසා තිබුණි. කෙසේ වුවද පවත්වන ලද සායනවල මාසික ප්‍රගතිය වාර්තා කිරීම සඳහා හඳුන්වා දෙන ලද සම්මත ආකෘතිය ප්‍රාදේශීය මැලේරියා නිලධාරීන් විසින් භාවිතා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම කාර්යයන්වල ප්‍රගතිය ඇගයීම් කළ නොහැකි විය.

**5.2.2 කෘමි පාලන පිළියම් සහිත කල් පවතින දැල් (Nets) බෙදාදීම**

රු.මිලියන 499.21 ක පිරිවැයකට කෘමි පාලන පිළියම් සහිත කල් පවතින දැල් 800,000 ක් ප්‍රසම්පාදනය කිරීමට හා පීඩාවට පත් ප්‍රදේශවල වෙසෙන ජනතාව සඳහා ඖෂධ ලබා දීමෙන් තොරව ඔවුන්ගේ පුද්ගලික ආරක්ෂාවට විශාල ආවරණයක් ලබා දීම සඳහා එම දැල් බෙදා හැරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන තිබුණි. කෙසේ වුවද, මැලේරියා මර්දන ව්‍යාපාරය විසින් එම දැල්වල ඵලදායී බව හා යෝග්‍ය බව ඇගයීම් කර නොතිබූ අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්නායකයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද එම දැල් භාවිතා කිරීම හා පිරිසිදු කිරීම පිළිබඳව අවශ්‍ය උපදෙස් ඒවා බෙදාහැරීමේදී ප්‍රතිලාභීන්ට නිකුත් කර නොතිබූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිලාභීන් විසින් එම දැල් විධිමත්ව භාවිතා කර නොතිබූ බවත් සමාලෝචන රැස්වීම් වලදී අනාවරණය වී තිබුණි.

**6. මූල්‍ය පාලන ගැටලු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාසික වැටුප් පත්‍රිකා විධිමත්ව පරීක්ෂා කර වගකිව යුතු නිලධාරියකු විසින් සහතික කර නොතිබීම හා වැටුප් රහිත නිවාඩු සඳහා විධිමත් වාර්තා නොමැති වීම හේතුවෙන් මානව සම්පත් පිරිවැය පිළිබඳ මූල්‍ය පාලනයන් ඉතා දුර්වල මට්ටමක වූ බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතියේ කටයුතුවලට අදාළ නොවන අතිකාල දීමනා, නිවාඩු දින ගෙවීම් හා ඉන්ධන ගෙවීම් ආදිය සම්බන්ධයෙන් මැලේරියා මර්දන ව්‍යාපාරය විසින් දරන ලද රු.357,444 ක් වූ වියදම් ආපසු ගෙවා තිබූ අතර ඒවා ව්‍යාපෘතියේ වියදම් ලෙස සලකා තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය හා බාහිර පාර්ශවයන් සඳහා ලබාදෙන ලද අත්තිකාරම් පිළිබඳ මූල්‍ය පාලනයන් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. තාත්වික ඇස්තමේන්තු මත අත්තිකාරම් ලබා දී නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2015 වර්ෂයේ අවස්ථා 85 කදී ලබාදෙන ලද එකතුව රු.මිලියන 4.24 ක් වූ අත්තිකාරම්වලින් සියයට 34 කට සමාන රු.මිලියන 1.45 ක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව ආපසු ගෙවා තිබුණි.

**7. කොන්ත්‍රාත් පරිපාලනය**

රු.මිලියන 1.70 ක පිරිවැයකට මානව සම්පත් මෘදුකාංග පැකේජයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා 2013 වර්ෂයේදී බාහිර පාර්ශවයකට ප්‍රදානය කරන ලද ටෙන්ඩරය 2016 මාර්තු 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. කාර්යය නිම කිරීම සඳහා සැපයුම්කරුට උපදෙස් දීමට හෝ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සහ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2013 වර්ෂයේදී ඒ සඳහා ගෙවන ලද රු.මිලියන 1.27 ක අත්තිකාරම වර්ෂ 02 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

**8. මතභේදයට තුඩුදෙන කරුණු**

ශ්‍රී ලංකාවේ වියළි හා අන්තර් මධ්‍ය කලාපවල ඇනෝෆිලස් කීටයන් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍යයින් ඇතිකිරීමේ ඵලදායිතාවය සම්බන්ධයෙන් පර්යේෂණයක් පැවැත්වීමට 2011 ජුනි මාසයේදී මැලේරියා මර්දන ව්‍යාපාරය විසින් දේශීය විශ්ව විද්‍යාලයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ගෝලීය අරමුදල් අයවැය හා මූල්‍ය වාර්තාකරණ මාර්ගෝපදේශයේ අංක 188 හා 189 වගන්තිවල විධිවිධානයන්ට පටහැනිව තරඟකාරී ලංසු ක්‍රියාවලියකින් තොරව ආයතනය තෝරාගෙන තිබූ අතර බැංකු ඇපකරයක් ලබානොගෙන රු.මිලියන 2.02 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. කෙසේ වුවද, ගිවිසුමේ දිනයෙන් වර්ෂ 04 ක් හා මාස 09 ක් ගතවීමෙන් පසුව 2016 මාර්තු මාසයේදී පර්යේෂණය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර තිබුණි. තවද ප්‍රදාන මුදල්වලින් රු.275,000 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද උපකරණ ගිවිසුමේ 5.2 වගන්තියට අනුව පර්යේෂණය අවසන් වීමෙන් පසු ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට භාර දිය යුතු වුවද එම වත්කම් භාර දී නොතිබුණි.